**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනතේ 11(1) වගන්තිය | අවම වශයෙන් සෑම මසකට එක්වරක් හෝ පාලක සභාවේ රැස්වීම් පැවැත්විය යුතු වුවත් 2019 ඔක්තෝබර් 25 දින පවත්වන ලද 168 වන පාලක සභාවෙන් පසුව 2021 ජූනි 18 දක්වා පැවැත්විය යුතු පාලක සභා 24ක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී නියමිත දින වකවානු තුළ පාලක සභාව රැස් කෙරේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව නියමිත පරිදි පාලක සභා රැස්වීම් පැවැත්විය යුතුය. |
| (ආ) | 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනතේ 11(2) වගන්තිය | 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනතේ 5(1)(අ)(i) අනුව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සභාපතිවරයා වන අතර සභාපතිවරයා විසින් පාලක සභාවේ අනෙකුත් සාමාජිකයින් අවම වශයෙන් දින 7කට පෙර දැනුම් දී පාලක සභාව කැඳවිය යුතු වුවත් පත්කර තිබූ පාලක සභාව කැඳවීමට සභාපතිවරයා විසින් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත දින වකවානු තුළ පාලක සභාව රැස් කෙරේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව නියමිත පරිදි පාලක සභා රැස්වීම් පැවැත්විය යුතුය. |
| (ඇ) | 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනතේ 13.1(ආ) වගන්තිය | නිලධරයින් හා සේවකයන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම පාලක සභාව සතු කාර්යයන් වුව ද මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන්, පාලක සභාවේ නියමය පරිදි ආයතනයේ අතිරේක අධ්‍යක්ෂවරියකට එරෙහිව වසර 4ක සිට රු.600,000ක් වැයකොට පැවැත්වෙමින් තිබූ විනය පරීක්ෂණයක් පාලක සභාවේ අනුමැතියකින් තොරව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් බහා තබා ඇයගේ ඉල්ලා අස්වීම පිළිගෙන පාරිතෝෂික ගෙවීමට තීරණය කර තිබුණි. | පාලක සභාවේ අවධානයට ලක් වී නොමැති නීත්‍යානුකූල නොවන තීරණ සම්බන්ධයෙන් නැවත සමාලෝචනය කර, පාලක සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනතේ 13.1(ආ) වගන්තිය | ආයතනය විසින් පවත්වනු ලබන උසස් ඩිප්ලෝමා පාඨමාලා හදාරන කණ්ඩායම සඳහා 2018 දෙසැම්බර් 06 දින සිදු වූ සිදුවීමක් සම්බන්ධයෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුත් කමිටුවක් විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (පුහුණු) සම්බන්ධව නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කොට තිබුණි. 2019 අප්‍රේල් 09 දින රැස් වූ 165වන පාලක සභාවේදී එම නිර්දේශ පිළිබඳ සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීම අනුමත කර තිබූ නමුත් අදාළ නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය විසින් එම නියෝග පිළිනොගැනීම හේතුවෙන් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් මත වැටුප් ගෙවීම නතර කර තිබුණි. එසේ වුවත් 2020 පෙබරවාරි 19 දින අධ්‍යක්ෂවරයා විසින් පාලක සභාවේ අනුමැතියකින් තොරව අනුයුක්ත කිරීම් අවලංගු කර වැටුප් ගෙවා තිබුණි. | පාලක සභාවේ අවධානයට ලක් වී නොමැති නීත්‍යානුකූල නොවන තීරණ සම්බන්ධයෙන් නැවත සමාලෝචනය කර, පාලක සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5(1) වගන්තිය | ආයතනයේ රියදුරෙකුට එරෙහිව සිදුකරන ලද විධිමත් විනය පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු අනුව ආයතනයේ අභ්‍යන්තර විගණක රියදුරු සමඟ දුස්සන්ධානගතව ඉන්ධන ඇණවුම්පත් මඟින් මුදල් වංචාවක් සිදුකර ඇති බව පරීක්ෂණ වාර්තාවේ විනය නියෝග ගැනීම සඳහා මඟපෙන්වීම් යටතේ පෙන්වා දී තිබුණි.<br><br>එහෙත් ඒ පිළිබඳ නොසලකා 2017 නොවැම්බර් 21 දින පැවති පාලක සභාවේ තීරණය පරිදි අදාළ අභ්‍යන්තර විගණන නිලධාරියාට උසස්වීමක් ලබා දී තිබුණි. එම නිලධාරියා 2018 ජූනි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයතනයේ සේවයෙන් ඉල්ලා අස්වී ඇති අතර ඔහුට හිමි පාරිතෝෂික මුදල ගෙවා නොතිබුණු හෙයින් ඔහු විසින් කම්කරු කොමසාරිස්වරයාට ඒ පිළිබඳ වාර්තා කිරීමෙන් අනතුරුව ඔහුට හිමි රු.469,287ක පාරිතෝෂික මුදල නියමිත දින නොගෙවීම නිසා රු.117,322ක අධිභාරයක් පනවා මුළු මුදල ම ගෙවන ලෙස නියෝග කර තිබුණි. 2020 පෙබරවාරි 27 දින එම මුදල ගෙවා තිබුණු අතර අධිභාරය වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර ආයතන වියදම් යටතේ දක්වා තිබුණි. | පාලක සභාවේ අවධානයට ලක් වී නොමැති නීත්‍යානුකූල නොවන තීරණ සම්බන්ධයෙන් නැවත සමාලෝචනය කර, පාලක සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,688,580ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාව රු.953,590ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,752,990ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ දායකත්වය රු.මිලියන 22කින් අඩු වීම මෙකී පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඩිප්ලෝමා පාඨමාලා ආදායම රු.4,516,125කින් හෙවත් සියයට 89.54කින් ද, විශේෂ ව්‍යාපෘති ආදායම රු.2,513,884කින් හෙවත් සියයට 51.08කින් ද අඩුවී තිබෙන අතර මානව සම්පත් සංවර්ධන වියදම රු.21,342,105කින් හෙවත් සියයට 81.80කින් පහළ ගොස් තිබුණි. එයට ප්‍රධාන හේතුව සමාලෝචිත වර්ෂයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම ඉතා පහළ මට්ටමක පැවතීම වේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා 2020 වර්ෂය වෙනුවෙන් නම් 72කින් සමන්විත සම්පත්දායක ලැයිස්තුවක් සකස් කර තිබුණ ද ඒ සඳහා පාලක සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. සම්පත්දායක ලැයිස්තුව සකස් කිරීමේදී සම්පත්දායක පුද්ගලයන් හඳුනාගැනීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදහස් දක්වා නැත | සම්පත්දායක නම් ලැයිස්තුව සඳහා පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර වාර්ෂිකව සම්පත්දායක ලැයිස්තුව සංශෝධනය කිරීමට විධිමත් වැඩපිළිවෙලක් දියත් කළ යුතුය. |
| (ආ) ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය වෙන ම සම්පත්දායක ලැයිස්තුවක් පවත්වාගෙන ගොස් ඇති අතර වැඩසටහන් නිලධාරීන් ද සම්පත්දායකයින් ලෙස කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. සම්පත්දායකයින් ලෙස සේවය ලබා දිය හැකි, සුදුසුකම් සහිත වැඩසටහන් නිලධාරීන් වෙතොත් ඔවුන් ද සම්පත්දායක ලැයිස්තුවට ඇතුළත් කිරීමට සුදුසු ක්‍රමවේදයක් දියත් කර නොතිබුණි. | අදහස් දක්වා නැත | විධිමත් පරිදි තෝරා ගත් සම්පත්දායකවරුන්ගේ පුහුණු වැඩසටහන් පැවැත්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) පළාත් පාලන ආයතනවල නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගැනීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුව කටයුතු නොකරන අතර ඉලක්කගත කණ්ඩායමට අමතරව අදාළ නොවන නිලධාරීන් ද සහභාගී වී තිබුණි. පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම මෙන් ම අවශ්‍යතාව සහිත නිලධාරීන් සහභාගී කරවා ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් නොවීම හේතුවෙන් පළාත් පාලන ආයතන මට්ටමෙන් එකම කණ්ඩායම විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමේ ස්වභාවයක් දක්නට ලැබුණි. | අදහස් දක්වා නැත | ඉලක්කගත කණ්ඩායම් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු අතර මේ සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් දියත් කළ යුතුය. |
| (ඈ) පුහුණු ආයතනයක් වන මෙම ආයතනයේ සංවිධාන සටහන එම අරමුණුවලට අනුකූල වන පරිදි විධිමත් ආකාරයට සකස් කර නොතිබුණි. ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම මත වූ නව තනතුරුවලට බලතල බෙදී යන ආකාරයට ක්‍රමවත් සංවිධාන සටහනක් සකස් කර නොතිබුණි. | නව තනතුරුවල ගැටලුසහගත තත්ත්වය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් නිරාකරණය කොට ගැනීමෙන් අනතුරුව බලතල බෙදී යන ආකාරයට ක්‍රමවත් සංවිධාන සැලැස්මක් වර්තමානය වන විට සකස් කරමින් පවතී. | තනතුරුවල බලතල බෙදී යන ආකාරයට ක්‍රමවත් සංවිධාන සටහනක් සැලසුම් කළ යුතුය. |
| (ඉ) බඳවා ගැනීමේ පටිපාටිය අනුව, උපදේශක (භෞතික සැලසුම්) වශයෙන් කටයුතු කරනු ලබන නිලධාරීයා පළාත් පාලන ආයතනවල භෞතික සැලසුම් සඳහා පුහුණු වැඩසටහන් හඳුනාගැනීම, සැලසුම් කිරීම, සංවිධානය, සම්බන්ධීකරණය සහ නෛතික හා තාක්ෂණික කාර්යයන්වලට උපදෙස් සැපයීම යන කාර්යයන් ඉටු කළ යුතු වුවත් වැඩ සටහන් නිලධාරියෙකුගේ කාර්යභාරයට වැඩිමනක් ඉටුකර නොතිබුණි. | වැඩසටහන් නිලධාරියෙකු නොමැති බැවින් එම කාර්යයන් ද උපදේශන සේවා 2ක් සහ සංවර්ධන සැලසුම් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | නියමිත පරිදි නිලධාරීන්ට රාජකාරි පැවරීම් හා ඒ පිළිබඳ කාර්යසාධන පරීක්ෂා කළ යුතුය. |
| (ඊ)කළමනාකරණ සහකාර නිලධාරීන් සහ වැඩසටහන් නිලධාරීන් හැර කාර්යමණ්ඩලයේ අනෙකුත් නිලධාරීන් සඳහා විධිමත් ආකාරයට රාජකාරි පවරා නොතිබුණි. | මෙම නිලධාරීන්ට පමණක් රාජකාරි ලිපි මගින් රාජකාරි පවරා තිබෙන අතර අනෙකුත් නිලධාරීන් සඳහා ඉදිරියේදී එම කටයුතු සිදු කිරීමට කටයුතු කරමි. | විධිමත් ලෙස නිලධාරීන්ට රාජකාරි පැවරිය යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය සඳහා මහල් 4කින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2013 වර්ෂයේදී ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන රු.53,196,907ක කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණු අතර ගොඩනැගිල්ලේ පයිල් අත්තිවාරම ඉදිකිරීම ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් උපකොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. මහල් 4කට ප්‍රමාණවත් පයිල් අත්තිවාරම ඉදිකර එය මහල් 8 දක්වා වැඩි කිරීමට තීරණය කර සැලැස්ම වෙනස් කිරීම හේතුවෙන් අදාළ පයිල් අත්තිවාරම මත ගොඩනැගිල්ල ඉදිකිරීම සුදුසු නොවන බව ආයතනය විසින් පිළිගෙන ඇති බැවින් මේ සඳහා දරන ලද රු. 44,757,072ක වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | නව ගොඩනැගිල්ල ඉදි කිරීම සම්බන්ධයෙන් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් කැබිනට් සංදේශයක් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව පසුගිය වියදම් සම්බන්ධයෙන් සොයා බැලීමට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත පැවරුණු අතර, ඉදිරි ඉදිකිරීම් වැඩකටයුතු සම්බන්ධයෙන් මොරටුව විශ්වවිද්‍යාලය හා සමඟ සාකච්ඡා වෙමින් පවතී. | ආයතනයේ ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කටයුතු පරීක්ෂාකර බලා රජයට අලාභයක් නොවන පරිදි ඉදිරි කටයුතු කඩිනම් කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් ඇති වූ නව තනතුරු සඳහා කාර්යමණ්ඩලය අන්තර්ග්‍රහණය කර ගැනීමට හා බඳවා ගැනීමට අදාළ වන බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමේ කටයුතු 2021 අගෝස්තු 31 දින දක්වා සිදු කර නොතිබුණි. | නව තනතුරු ලෙස ඇති කළ තනතුරු සඳහා කුමන වැටුප් කේතයට අදාළ තනතුරු අනුමත කොට තිබේ ද යන්න අපැහැදිලි බැවින් මේ පිළිබඳ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විමසීමට ලක්කර ඇති අතර එහි තීරණ ලැබෙන තෙක් බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට නොහැකි වී ඇත. | සංශෝධනය කඩිනමින් නිසි පරිදි සිදු කළ යුතුය. |
| (ආ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 15.1 (IX) සහ ආයතනයේ බඳවාගැනීමේ පරිපාටියේ 4 වගන්තිය නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නොපැවැත්වීම හේතුවෙන් නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම සහ උසස් කිරීම විධිමත්ව සිදුවී නොතිබුණි. | අනුමැතිය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකර ඇත. | ආයතන සංග්‍රහයේ සඳහන් කර ඇති පරිදි නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවැත්වීමට හා විධිමත් පරිදි නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම සහ උසස් කිරීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)අධ්‍යක්ෂවරයා විසින් භාණ්ඩාගාරයෙන් නියම කරන ලද පාරිශ්‍රමික ලබා නොගෙන HM 2-2 වැටුප් කේතයේ 10වන වැටුප් පියවර වූ රු.114,645ක මාසික වැටුපක් ලබාගෙන තිබූ බැවින් 2020 පෙබරවාරි සිට 2021 අගෝස්තු දක්වා රු.513,000ක මුදලක් වැඩිපුර ලබාගෙන තිබුණි. | පරීක්ෂා කර, නිවැරදි කිරීමක් තිබේ නම් නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | වැඩිපුර ගෙවන ලද වැටුප අයකර, නිවැරදි වැටුප් පියවරේ තැබිය යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුව ද 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2021 ජුනි 30 දින ඉදිරිපත් කර තිබුණි. | පාලක සභාව රැස්වීමට නොහැකි වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ නියමයන්ට අනුව දිගුකාලීන දැක්මක් සහිතව ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරී සැලැස්මක් වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කර නොතිබූ අතර එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම්/ ප්‍රතිඵල ඇතුළත් වන පරිදි ආයතනය විසින් පිළියෙල කර ඇති ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | චක්රලේඛයේ සඳහන් පරිදි ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කරමි. | නියමිත පරිදි සකස් කළ යුතු වේ. |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1971 අංක 38 දරන මුදල් පනතේ 8 වන වගන්තිය අනුව රජයේ සෑම නීතිගත සංස්ථාවක් විසින්ම අදාළ මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03කට නොවැඩි කාලයකට පෙර අයවැය ලේඛනයක් පිළියෙල කර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුව ද 2020 වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සඳහා පාලක සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මේ නිසා අනුමත අයවැය සීමාවලින් තොරව ආයතනය විසින් වියදම් දැරීම සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම පාලක මණ්ඩලය විසින් 2020 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් අනුමත නොකිරීම සම්බන්ධයෙන් මුදල් හා ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PED 01/2020 චක්‍රලේඛයේ 9 ඡේදයේ සඳහන් ඇමුණුම A කෙරෙහි පාලක මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි අයවැය ලේඛනයක් ඉදිරිපත් කෙරේ. | නීතිරීති රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

### 4.4 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයට අදාළ පාරිසරික හා සමාජ වගකීම් හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරනු ලැබේ | නියමිත පරිදි කටයුතු කළ යුතුය. |

### 4.5 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත | පනතේ විධිවිධාන ප්‍රකාරව ආයතනය කටයුතු කළ යුතුය. |